## ශ්‍රී ලංකා වරාය අධිකාරිය
### තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. <u>තනතුර : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) - (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තුන්වන මට්ටම) – SLM 3</u>**

**(අ) යෝග්‍යතාවය**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ/ වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරි ආයතනයේ/ සහතිකලත් වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ පූර්ණ සාමාජිකත්වය සහ පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

**සමඟ**

**පළපුරුද්ද :**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සමාන තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

**(ආ)** වැටුප

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 3 : 3 (SLM 3) |
| ආරම්භක වැටුප | : | රු. 109,215/= |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,945/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 204,500/= ක් පමණ වේ.

**වයස් සීමාව : වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි)**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක/ කොට්ඨාශයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය - විධායක අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙනසේ 2026-09-21 වන දින හෝ ඊට පෙර <u>ලියාපදිංචි තැපෑලෙන්</u> එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**<u>අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**